# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2486/10 - 2026 අප්‍රේල් මස 28 වැනි අඟහරුවාදා - 2026.04.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15(I) වන වගන්තිය යටතේ වූ පවරා ගැනීමේ නියෝගය අවලංගු කිරීම

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(I) වන වගන්තිය යටතේ එවකට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙත පැවරී තිබූ බලතල ප්‍රකාර, 2021.08.12 දිනැති අංක 2240/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද්දා වූ 15(I)වන වගන්තිය යටතේ නියමයෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය සතු කරනු ලැබීය.

එනමුත්, නාගරික සංවර්ධන අධිකාරියේ කාර්යයන් සඳහා අධිකාරියට එකී දේපල අවශ්‍ය නොවන බවට ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා වන  බිමල් නිරෝෂන් රත්නායක වන මම තීරණය කරන හෙයින්, අංක 2240/35 සහ 2021.08.12 වැනි දින රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද ඉහත 15(I) වන වගන්තිය යටතේ වූ නියෝගය මෙයින් අවලංගු කරමි.

**බිමල් නිරෝෂන් රත්නායක (පා.ම.),**
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 අප්‍රේල් මස 20 වන දින,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
12 වන මහල, සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ රාජගිරිය ගමේ පිහිටි බලය ලත් මිනින්දෝරු සහ තලමිතිකරු එස්. වික්‍රමසිංහ මහතා විසින් පිළියෙල කරන ලද අංක 6912/9000 සහ 2013.05.31 දිනැති සැලසුමෙහි කැබලි අංක A1 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1496 (අක්කර 0 රූඩ් 1 පර්චස් 19.15) ක් පමණ වන පහත සඳහන් මායිම් වලින් සමන්විත ඉඩම.

*උතුරට* : රාජගිරිය උද්‍යානය සහ රාජගිරිය උද්‍යානයේ වරිපනම් අංක 615/1B දරන ස්ථානය

*නැගෙනහිරට* : රාජගිරිය උද්‍යානයේ වරිපනම් අංක 615 දරන ස්ථානය

*දකුණට* : මහනගර සභා පාර සහ රාජගිරිය උද්‍යානයේ වරිපනම් අංක 615/1/1B දරන ස්ථානය

*බටහිරට* : රාජගිරිය උද්‍යානයේ වරිපනම් අංක 615/1/1B දරන ස්ථානය සහ මහනගර සභා පාර

EOG 04 - 0213


1A - G 46714 — 04 (2026/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*